මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# Human Rights Commission of Sri Lanka

ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07

**රාජ්‍ය ආයතන තුළ සේවය කරන අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවා නියුක්තිකයින්ට 2020 පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී වැටුප් සහිතව පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවන පරිදි නිවාඩු ලබාදීම**

ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ විධි විධාන නිසි ලෙස ක්‍රියාකරනු ලබන බවට සහතික කිරීමේ අදහසින් එම නීතීන් හා අයිතිවාසිකම් වලට ගරු කිරීම, ප්‍රවර්ධනය කිරීම පිණිස විධායක, පරිපාලනමය පිළිවෙත් පිළිබඳ සුපරීක්ෂාවෙන් සිට නීතිමය හා පරිපාලනමය කාර්යය පටිපාටීන් සකස්කිරීමෙහිලා රජයට අවශ්‍ය උපදෙස් ලබාදීම, සහායවීම සහ එම කාර්යය නිසි පරිදි අදාළ ආයතන විසින් ක්‍රියාත්මක කරන්නේ ද යන්න පිළිබඳව හා ඉහත අවශ්‍යවන්නා වූ සියළු දේ කිරීමට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව බලතල අප කොමිෂන් සභාවට හිමිව ඇත.

මෙවර පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී ද "**කිසිවෙකු අත්නොහැරෙන පාර්ලිමේන්තු මහ මැතිවරණයක් තහවුරු කරමු**" යන තේමාව ඔස්සේ පුරවැසියන්ගේ පරමාධිපත්‍ය ඡන්දය ප්‍රකාශකිරීම තුළින් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කටයුතු කරගෙන යනු ලැබේ. පුරවැසියන්ගේ පරමාධිපත්‍ය තහවුරු කරගැනීම සඳහා රාජ්‍ය ආයතන තුළ සේවය කරන අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවා නියුක්තිකයින්ට ද ජාතික මැතිවරණ වලදී වැටුප් සහිතව පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවන පරිදි නිවාඩු ලබාදීම සඳහා සුදුසු මැදිහත්වීමක් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙතින් සිදුවීම එම සේවකයින්ගේ ද සර්වජන ඡන්ද බලය භාවිතා කිරීමට මහඟු පිටිවහලක් වනු ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලැබේ.

ඒ අනුව ඔබ අමාත්‍යාංශය මේ සඳහා කඩිනම් සුදුසු මැදිහත්වීමක් සිදුකරනු ඇතැයි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අපේක්ෂා කරනු ලැබේ.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

ආචාර්ය දීපිකා උඩගම,
සභාපතිනිය,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2020 ජූලි මස 13

පිටපත : 01. සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව.

ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் / Head Office: 14, ආර්. ඒ. ද. මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04. / 14, R.A.De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk